ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2006/2007

**ESC 1125 /1136 -** ගණිත කුසලතා සංවර්ධනය

කාලය පැය දෙකයි.

---

දිනය - 2006.10.26      වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. i. පෙර පාසල් දරුවන් තුළ"එකට එක අනුරූපතාව" ගණිත සංකල්පය සංවර්ධනය කිරීම සඳහා ඔබ සැලසුම් කරන ක්‍රියාකාරකම් දෙකක් විස්තර කරන්න.

(ලකුණු 08)

ii. එම ක්‍රියාකාරකම් දෙක සඳහා ඔබ යොදා ගන්නා ගුරු උපකරණ රූප සටහන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 07)

iii. එම ගුරු උපකරණ යොදා ගෙන ළමයින් ක්‍රියාකාරකම්වල යොදවන අන්දම පියවරෙන් පියවර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02. i. පෙර පාසල් දරුවන් තුළ ගණිත සංකල්ප සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයකුට ප්‍රයෝජනවත් විය හැකි ළමා රුචිකම් පහ (05) ක් දක්වන්න.

(ලකුණු 05)

ii. ඔබ දැක් වූ රුචිකම් අතරින් ඕනෑම හතර (04) ක් තෝරාගෙන, පෙර පාසල් ළමයින් තුළ තේරීම ගණිත සංකල්පය සංවර්ධනය කිරීම සඳහා ඒවා යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. i. පියාජේ විසින් ඉදිරිපත් කරන ලද ප්‍රජානන සංවර්ධන අවධි අනුපිළිවෙලින් දක්වන්න.

(ලකුණු 08)

ii. මෙම අවධි අතරින් ඕනෑම අවධි දෙකක් තෝරාගෙන එහි ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරන්න.

(ලකුණු 17)

04. i. ද්‍රව්‍ය අතර පැවතිය හැකි විවිධ සම්බන්ධතා වන "එකම වර්ගයට අයත්වීම" "අයිතිය" සහ "වස්තූන් සන්නද්දනය කිරීම" පෙර පාසල් දරුවන් තුළ සංවර්ධනය කළ හැකි කතන්දරයක් ලියන්න.

(ලකුණු 15)

ii. ඔබ විසින් ලියන ලද කතන්දරය පැවසීමේ දී ඉහත සඳහන් සම්බන්ධතා තහවුරු කිරීම සඳහා ගුරු උපකරණ හා ප්‍රශ්න කිරීම භාවිත කරන අන්දම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

05. පහත සඳහන් ගණිත සංකල්ප සංවර්ධනය කිරීමට සුදුසු ඉගැන්වීමේ උපකරණ කට්ටල (එක් සංකල්පයක් සඳහා එක බැගින්) රූප සටහන් සහිතව පැහැදිලි කරන්න.

(අ) පටිපාටිගත කිරීම
(ආ) සමමිතිය
(ඇ) ධාරිතාව
(ඈ) බර
(ඉ) අසර

(ලකුණු 05 x 05 = 25)

06. i. පෙර පාසල් ගුරුවරියක වශයෙන් ඔබ විසින් ප්‍රගුණ කළයුතු විශේෂ ගුණාංග පහක් (05) ක් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. ඔබ ඉදිරිපත් කළ ගුණාංග අතරින් තුනක් (03) තෝරාගෙන පෙර පාසල් ළමයින් සමග ක්‍රියා කිරීමේ දී මෙම ගුණාංග ප්‍රගුණ කර සිටීම ඔබට ප්‍රයෝජනවත් වන අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 15)

- හිමිකම් ඇවිරිණි. -